# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

2 ශ්‍රේණිය - බුද්ධ ධර්මය - දෙසැම්බර් මාසය - 3 වන සතිය

සැකසුම :- බලංගොඩ අධ්‍යාපන කලාපය.

M.A.R.P.කුමාරි - ර/රත්මලවත්ත මහා විද්‍යාලය

දුවලා පුතාල මේ වන විට බුද්ධ ධර්මය පොතේ සියලු පාඩම් ඉගෙනගෙන ඉවරයි. දැන් එහෙනම් පුතාලා ගොඩක් හොද ළමයි. මොකද දන්නවද ඔයාල ගොඩාක් ගුණ ධර්ම මේ පාඩම් තුලින් ඉගෙන ගත්තා. අපි බලමු පුතාලට මේ පාඩම් තුලින් ඉගෙන ගත් ශාසනික වචන මතකද කියලා. එහෙනම් මේ වචන ටික යා කරලා ශාසනික වචන ඉගෙන ගනිමු.

| | |
|---|---|
| වතුර | තේ |
| ගිලන්පස | බුලත් |
| දැහැත් | තැගි |
| මළුව | පැන් |
| පිරිකර | මිදුල |

| | |
|---|---|
| අමදිනවා | නිදාගන්නවා |
| වඩිනවා | අතුගානවා |
| වළදනවා | සෝදනවා |
| සැතපෙනවා | එනවා/යනවා |
| දෝවනය කරනවා | කනවා. |

එහෙනම් දුවලා පුතාලට පුලුවන් පන්සලට ගොස් වදින ස්ථාන පිලිවෙලින් යා කරන්න.

| | |
|---|---|
| • පළමුව වදින්නේ | • බුදු පිළිම වහන්සේ |
| • දෙවනුව වදින්නේ | • වෙහෙර වහන්සේ |
| • තෙවනුව වදින්නේ | • බෝදීන් වහන්සේ |

එහෙනම් දුවලා පුතාලා එම වදිම ස්ථාන චිත්‍රයට නගන්න.

බෞද්ධ කොඩිය පාට කොල ඉරා (කොලාජ් ක්‍රමයට) අලවා නිර්මාණය කරමු.

මේ පාඩමට අයත් වීඩියෝ පාඩම නැරඹීම සදහා youtube එකට ගොස් Renuka kumari “ශාසනික වචන” ලෙස type කරන්න.

“හොදයි ආදරණීය දුවේ, පුතේ ඔයාලට තෙරුවන් සරණයි!”